ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# මාතර දිස්ත්‍රික්කයේ දීර්ඝකාලීන ගංවතුර උවදුරට හේතු සාධක සහ ඒ මගින් සිදුව ඇති මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ අධ්‍යයන වාර්තාව

**ජූලි 2026**

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

# මාතර දිස්ත්‍රික්කයේ දීර්ඝකාලීන ගංවතුර උවදුරට හේතු සාධක සහ ඒ මගින් සිදුව ඇති මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ අධ්‍යයන වාර්තාව

**ජූලි 2026**

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

# පටුන


| | පිටුව |
|---|---|
| පටුන | ii |
| පෙරවදන | iii |
| 1 වන කොටස - | |
| මාතර දිස්ත්‍රික්කයේ දීර්ඝකාලීනව ගංවතුර උවදුරට හේතු සාධක පිළිබඳ විමසීම | 1 |
| 1. හැඳින්වීම | 1 |
| 2. අධ්‍යයන පසුබිම | 1 |
| 3. අධ්‍යයනයේ අරමුණ | 2 |
| 4. මානව හිමිකම් ප්‍රමිතින් | 3 |
| 5. නිල්වලා ගඟ ආශ්‍රිතව සිදුව ඇති ගංවතුර පාලන සහ සංවර්ධන වැඩසටහන් | 4 |
| 6. තොරතුරු හා දත්ත එකතු කිරීමේ ක්‍රමවේදය | 5 |
| 7. සිවිල් සංවිධාන සහ ගොවි සංවිධාන නියෝජිතයන්ගේ මතය | 6 |
| 8. වගකිවයුතු රාජ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ලද කරුණු | 7 |
| 2 වන කොටස | |
| මානව හිමිකම් උල්ලංඝනය වීම් සහ ජනතා පීඩාවන් පිළිබඳව නිරීක්ෂණ | 11 |
| 1. ගංවතුර නිසා සිදුවූ සමාජීය, ආර්ථික හා කෘෂිකාර්මික හානිය | 11 |
| 2. නිල්වලා ගඟේ වැදගත්කම සහ පානීය ජල සැපයුම | 11 |
| 3. ලවණ බාධකයේ ඉතිහාසය සහ ව්‍යාපෘති පසුබිම | 12 |
| 4. සැලසුම්කරණයේ දෝෂ සහ පූර්ව අධ්‍යයනවල දුර්වලතා | 12 |
| 5. රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය බිඳවැටීම සහ කළමනාකරණ දුර්වලතා | 13 |
| 6. විමර්ශන ක්‍රියාවලිය සහ කොමිෂන් සභාවේ අවසාන නිගමනය | 14 |
| 3 වන කොටස | |
| ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිගමන සහ නිර්දේශ වාර්තාව | 15 |
| නිගමනය සහ නිර්දේශ | 15 |
| 1. කෙටි කාලීන විසඳුම් (මාස 06ක් ඇතුළත ආරම්භ කළ යුතුය) | 15 |
| 2. මධ්‍ය කාලීන විසඳුම් (වසරක් ඇතුළත ආරම්භ කළ යුතුය) | 16 |
| 3. දිගු කාලීන විසඳුම් (වසර 02ක් ඇතුළත ආරම්භ කළ යුතුය) | 19 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 22 |

## පෙරවදන

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත මෙහෙවර වනුයේ මෙරට සියලුම පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණය තුළ සිදුවන මානව හිමිකම් උල්ලංඝනයන් වළක්වාලීමයි. 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව, කොමිෂන් සභාව නිරන්තරයෙන්ම සමාජයීය, ආර්ථික සහ පාරිසරික යුක්තිය වෙනුවෙන් පෙනී සිටියි. මෙම පසුබිම තුළ, දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ ජනතාව දීර්ඝකාලීනව මුහුණ දෙන ගංවතුර උවදුර සහ 2023 වසරේ ඇති වූ අසාමාන්‍ය ආපදා තත්ත්වය පාදක කරගනිමින් රාජ්‍ය ආයතනවල වගකීම සහ මානව හිමිකම් බලපෑම ඇගයීම සඳහා මෙම විශේෂ විමර්ශන වාර්තාව සකස් කර ඇත.

පරිසරය යනු මානව වර්ගයාගේ පැවැත්මේ සහ සංවර්ධනයේ මූලික පදනම වුවද, ඇතැම් අවස්ථාවලදී සිදුවන ස්වාභාවික විපත් සහ අදූරදර්ශී මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එය මිනිසාටම මහත් ව්‍යසනයක් බවට පත්වේ. සර්මකලාපීය රටක් වන ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාසයන්ට දැඩි ලෙස ගොදුරු වන අතර, 2023 වසරේ නිරිතදිග මෝසම් බලපෑම හේතුවෙන් මාතර දිස්ත්‍රික්කයට දැඩි ගංවතුර තත්ත්වයකට මුහුණ දීමට සිදු විය. මෙහි ඇති සුවිශේෂීම සහ ඛේදජනක තත්ත්වය වනුයේ, ගංවතුර ජලය බැස යාමට සති සහ මාස ගණනාවක් ගත වීම හේතුවෙන් ජනතාවගේ දෛනික ජන ජීවිතය, සෞඛ්‍යය සහ ජීවනෝපාය මාර්ග සම්පූර්ණයෙන්ම අඩාල වීමයි.

මෙම විමර්ශනය සඳහා මූලිකම පාදක වූයේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත වින්දිත පාර්ශවයන් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි ද්විත්වය (පැමිණිලි අංක: එච්.ආර්.සී/එම්.ටී/392/23 සහ එච්.ආර්.සී/එම්.ටි.ආර්60/23) සහ කොමිෂන් සභාවේ පර්යේෂණ සහ අධීක්ෂණ අංශය විසින් සිදු කරන ලද මාධ්‍ය අධීක්ෂණ තොරතුරු වේ. දින ගණනාවක් පුරා ජලය එකතැන පල්වීම හේතුවෙන් පාසල් වසා දැමීමට සිදුවීම, දෛනික ආදායම් අහිමි වීම, මී උණ සහ ඩෙංගු වැනි වසංගත රෝග පැතිර යාම මෙන්ම ගොඩබිමට කිඹුලන් පැමිණීම නිසා දරුවන් ඇතුළු සමස්ත මහජනතාව දැඩි ජීවිත අවදානමකට ලක්ව ඇති බව මෙම අධ්‍යයනයේදී නිරීක්ෂණය විය.

මෙම විපත්තිය ස්වාභාවික සංසිද්ධියක් මතම පමණක් සිදු වූවක් ද, නැතහොත් ප්‍රදේශවාසීන් දක්වන ලෙසින් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන එක්ව නිල්වලා ගඟ හරහා ඉදිකරන ලද ස්ථිර ලවණ බාධකයේ සැලසුම්කරණ සහ කළමනාකරණ දෝෂයන් නිසා ඇති වූවක් ද යන්න සෙවීම කොමිෂන් සභාවේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව විය. ඒ වෙනුවෙන් විද්‍යාත්මක ක්‍රමවේදයන් ඔස්සේ ද්විතීක දත්ත විශ්ලේෂණය කරමින් ද, වගකිවයුතු රාජ්‍ය ආයතන, සිවිල් සංවිධාන සහ ගොවි සංවිධාන නියෝජිතයන් කැඳවා සාකච්ඡා වට කිහිපයක් පවත්වමින් ද, ක්ෂේත්‍ර චාරිකා මඟින් සත්‍ය තත්ත්වය නිරීක්ෂණය කරමින් ද මෙම වාර්තාව සකස් කිරීමට පියවර ගන්නා ලදී.

වාර්තාව මඟින් පැහැදිලිවම අනාවරණය කරගන්නා ලද ප්‍රධානතම කරුණක් වන්නේ, ඓතිහාසික ඕලන්ද ඇළ වසා දැමීම, පැරණි වාරි පද්ධති නිසි ලෙස නඩත්තු නොකිරීම, දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් සහ ලවණ බාධකයේ සවිකර තිබූ යකඩ තහඩු වැටවල් (Sheet piles) වැනි මානව සහ ඉංජිනේරුමය සාධක ගණනාවක් ජලය බැස යාම ප්‍රමාද වීමට සෘජුවම බලපා ඇති බවයි. එමෙන්ම, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබා දුන් තාක්ෂණික උපදෙස් සහ පූර්ව ඉංජිනේරු නිර්දේශ රාජ්‍ය ආයතන විසින් නිසි ලෙස නොපිළිපැදීම සහ ආයතන අතර පැවති සම්බන්ධීකරණ බිඳවැටීම හේතුවෙන් මෙම ව්‍යසනයේ බරපතලකම වැඩි වී ඇත.

ස්වාභාවික හෝ මානව ක්‍රියාකාරකම් මත සිදු වන මෙවැනි ව්‍යසනයන් තුළින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ (UDHR) සඳහන් ජීවත්වීමේ අයිතිය, ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් සඳහා ඇති අයිතිය සහ

ඉහළම සෞඛ්‍ය ප්‍රමිතියක් භුක්ති විඳීමේ අයිතිය සෘජුවම උල්ලංඝනය වේ. එමෙන්ම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 12(2), සහ 14 වගන්ති මගින් සහතික කර ඇති නීතිය ඉදිරියේ සමානවීමේ සහ නිදහසේ රැකියාවක නියුක්ත වීමේ මූලික අයිතිවාසිකම් ද මෙමගින් ජනතාවට අහිමි වී ඇති බව කොමිෂන් සභාවේ අවසාන නිගමනයයි.

මෙම වාර්තාව හුදෙක් රාජ්‍ය ආයතනවල දුර්වලතාවයන් විවේචනය කිරීම සඳහා පමණක් සීමා නොවී, මාතර දිස්ත්‍රික්කයේ ජනතාව මෙම පීඩාවෙන් මුදවා ගැනීම සඳහා ගත යුතු කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන විසඳුම් රැසක් ඉදිරිපත් කර ඇත. අගතියට පත් ගොවීන්ට විද්‍යාත්මකව තක්සේරු කළ වන්දි ලබා දීම, ජීවනෝපාය අහිමි වූ අවිධිමත් අංශවල පිරිස් වෙත සහන සැලසීම, රොන්මඩ ඉවත් කිරීම, ඕලන්ද ඇළ ප්‍රතිසංස්කරණය සහ ප්‍රධාන පොම්පාගාර යාවත්කාලීන කිරීම වැනි නිර්දේශ ඒ අතර ප්‍රධාන වේ. තවද, ඉදිරි ජාතික ව්‍යාපෘති සඳහා දේශපාලන බලපෑම්වලින් තොර ජාතික ප්‍රතිපත්තියක් සැකසීමේ සහ "ආපදා හානිපූර්ණ භාර අරමුදලක්" පිහිටුවීමේ වැදගත්කම ද මෙහිදී අවධාරණය කර ඇත.

අවසාන වශයෙන්, මෙම පර්යේෂණ වාර්තාව සාර්ථකව නිම කිරීම සඳහා දත්ත සහ තොරතුරු සපයමින් සහයෝගය දැක්වූ සියලුම රාජ්‍ය නිලධාරීන්ට, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට, සිවිල් හා ගොවි සංවිධාන නියෝජිතයින්ට සහ සියලුම සාක්ෂිකරුවන්ට කොමිෂන් සභාවේ කෘතඥතාව පිරිනමමි. මෙම වාර්තාවේ අන්තර්ගත නිර්දේශයන් නියමිත කාලරාමුව තුළ ක්‍රියාත්මක කිරීම තුළින් මාතර දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් සහ පාරිසරික යුක්තිය තහවුරු වනු ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැඩිව විශ්වාස කරයි.

# 1 වන කොටස

## මාතර දිස්ත්‍රික්කයේ දීර්ඝකාලීනව ගංවතුර උවදුරට හේතු සාධක පිළිබඳ විමසීම

### 1. හැඳින්වීම

පරිසරය යනු පුද්ගලයාගේ පැවැත්මට, වර්ධනයට හා ක්‍රියාකාරිත්වයට බලපාන්නා වූ අභ්‍යන්තරික හා බාහිර සාධකවල සමස්තය වේ. එහි උප පද්ධතියක් ලෙස ජලජ උප පද්ධතිය හඳුන්වා දිය හැකිය. ඒ අනුව පරිසරය මිනිස් අවශ්‍යතා ඉටු කරන අතරම විවිධ විපත් ඇති කරයි. ස්වභාවික විපත්, සුනාමි, සුළි සුළඟ සහ ගංවතුර ඒ අතර වේ.

සර්මකලාපීය රටක් වන ශ්‍රී ලංකාව බොහෝ දේශගුණික විපර්යාසයන්වලට ගොදුරු වන රටකි. ඒ නිසාම වර්තමානය වන විට ශ්‍රී ලංකාව ද අනිකුත් රටවල් හා සමානව ස්වභාවික විපත් පිළිබඳව වැඩි අවධානයක් යොමු කර ඇත. වර්ෂ 2004 දී ඇති වූ සුනාමි ව්‍යසනය ශ්‍රී ලංකාවට මෙතෙක් බලපෑ ප්‍රබලම ස්වභාවික විපත්වලින් එකකි(Disaster Management Centre [DMC], 2014). එසේම 2023 වසරේ නිරිතදිග මෝසම අසාමාන්‍ය ලෙස සක්‍රීය වීම හේතුවෙන් වරින් වර ගංවතුර සහ නායයෑම් දිවයිනේ විවිධ ප්‍රදේශවලින් වාර්තා විය.

ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය සඳහන් කළ ආකාරයට 2023 වසරේ ඔක්තෝබර් මාසයේ ඇති වූ ගංවතුර හේතුවෙන් වැඩිම පීඩාවන්ට පත්ව ඇත්තේ ගම්පහ, ගාල්ල සහ මාතර යන ප්‍රදේශ වේ(DMC, 2023). මෙම ප්‍රදේශ අතරින් මාතර දිස්ත්‍රික්කය මෙම අධ්‍යනයේ විශේෂිත ක්ෂේත්‍රය වේ. එයට හේතුව මාතර දිස්ත්‍රික් ජනයා දීර්ඝ කාලයක සිට මෙම පීඩාවන්ට පත්ව තිබීමත්, එසේම 2023 වසරේදී ඇති වූ ගංවතුර තත්ත්වය මත ජලය බැස යාමට සති ගණනාවක් ගත වීමත් වේ. ස්වාභාවික විපත් සිදු වීමත් සමග ජනතාවගේ බොහෝ මානව හිමිකම් උල්ලංගනයන් සිදු විය හැක. එවැනි තත්ත්වයන් යටතේ ඔවුන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම ඉතාමත් වැදගත් වේ.

### 2. අධ්‍යයන පසුබිම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත පැමිණිලි අංක එච්.ආර්.සී/එම්.ටි/392/23 හා එච්.ආර්.සී/එම්.ටි.ආර්60/23 යටතේ පැමිණිලිකරුවන් විසින් ගොනු කරන ලද පැමිණිලි සහ කොමිෂන් සභාවේ මෙහෙයවීමෙන් එහි පර්යේෂණ සහ අධීක්ෂණ අංශය මගින් කරනු ලැබූ පර්යේෂණය අනුව ආවරණය කරගත් අධ්‍යයන චාරිකාව මෙම අධ්‍යයනයට පාදක විය. ඊට අමතරව 2023 වර්ෂයේ ඇති වූ වර්ෂාපතනය හා ගංවතුර තත්ත්වය මත දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ ජනතාව විශාල වශයෙන් පීඩාවට පත්ව තිබීම ද අවධානයට යොමු විය.

එහිදී එහි ජනතාවට පහත දක්වන දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වී ඇත:

1. අධික වර්ෂා තත්ත්වය හේතුවෙන් පහත්බිම් හා මාර්ග ජලයෙන් යටවී තිබීම.
2. ගංවතුර පහව නොයෑම නිසාවෙන් පාසල් වසා දැමීමට සිදු වීම.
3. මෙම කාලය තුළ දෛනික ඉපයීම සිදුකළ බොහෝ පිරිසකට ජීවනෝපාය අහිමි වීම (ඔක්තොම්බර් 10 වැනිදා 'අරුණ' පුවත්පත් වාර්තාව).

4. දින ගණනාවක් ගංවතුර බැස නොයෑම හේතුවෙන් සෞඛ්‍ය ගැටලු රැසක් මතුවීම. ඒ අතර ලෙප්ටෝස්පයිරෝසිස් (Leptospirosis / මී උණ), ඩෙංගු සහ පාචනය වැනි වසංගත තත්ත්වයන් රැසක් ද වාර්තා වී ඇත.
5. දිගු කලක් ගංවතුර බැස නොයෑමේ ප්‍රතිඵලයක් ලෙස ගොඩබිම ප්‍රදේශයට කිඹුලන් පැමිණීම සිදු වීම නිසා ද තවදුරටත් මාතර දිස්ත්‍රික්කයේ ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට පත් ව ඇත. කිඹුලන් නිතර නිවෙස් අසල ගැවසීම නිසා කුඩා දරුවන් දැඩි අවදානමකට ලක්ව ඇත (නොවැම්බර් 12 'අරුණ' පුවත්පත් වාර්තාව).
6. මාතර ප්‍රදේශයේ පවතින අඛණ්ඩ වර්ෂාව නිසා නායයෑම් සහ ගස් කඩා වැටීම් හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 16 ක ඔක්තෝබර් මාසය තුළ දී පවුල් 9,448 ක් පීඩාවට පත්ව සිටීම.

මේ සියලුම වාර්තා දක්වන පරිදි 2023 වසරේ ඇති වූ ගංවතුරෙන් මාතර ජනතාව විවිධාකාරයෙන් පීඩාවට පත්වීම සිදු විය. ගංවතුර නිසා ඇති වූ ආපදා තත්ත්වය මාස කිහිපයක් මෙම ප්‍රදේශයට බලපෑම නිසා මෙලෙසින් මෙම අධ්‍යයනය සිදු කිරීමට තීරණය කරන ලදී.

**3. අධ්‍යයනයේ අරමුණ**

**පර්යේෂණ ගැටලුව:**

2023 වර්ෂයේ දී මාතර දිස්ත්‍රික්කයේ ඇති වූ ගංවතුර බැස නොයෑමට බලපාන ලද ස්වාභාවික හා මානව ක්‍රියාකාරි හේතුන් මොනවාද? යන්න අධ්‍යයනය කිරීම වේ.

**අධ්‍යයන පරාසය:**

2023 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ දීර්ඝකාලීන ගංවතුර තත්ත්වයක් නිර්මාණය වීමට බලපෑ ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් මොනවාද යන්න හා එම තත්ත්වය අවම කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳවයි. නිල්වලා ගඟ හරස් කොට බැඳි ලවණ බාධකය, ඇළ මාර්ග අමුණු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හා ඒ හා සම්බන්ධ අනෙකුත් බැඳුණු ගැටලු සහගත තත්ත්වයන් අධ්‍යයනය කොට ඒ සඳහා ප්‍රතිකර්ම කළ යුත්තේ කුමන ආකාරයටද යන්නත්, වගකිවයුතු ආයතන මොනවාද යන්න හඳුනා ගැනීමත් මෙයින් අපේක්ෂා කරන ලදී.

**අධ්‍යනයේ ප්‍රධාන අරමුණ:**

මාතර දිස්ත්‍රික්කයේ ගංවතුර තත්ත්වය ඇති වීමට බලපා ඇති හේතුන් සඳහා රාජ්‍ය ආයතනවල සහභාගීත්වය හඳුනා ගැනීම.

**නිශ්චිත අරමුණු:**

1. 2023 වර්ෂය ශ්‍රී ලංකාවේ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවකට අයත් භූමි ප්‍රදේශ ගණනාවකට සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ගංවතුර බැස නොයෑමෙන් සිදු වූ ආපදා තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වූයේ පරිසරයේ පැවති ස්වභාවික

තත්ත්වයන් හේතු කොට ගෙනද, නැතහොත් ගිං ගඟ (නිල්වලා ගඟ) හරහා ඉදිකර ඇති ලවණ බාධකයේ ඉදිකිරීම් නිසි අයුරින් සැලසුම් නොකිරීම හේතුවෙන් ඇති වූ අතුරු තත්ත්වයන් නිසාද යන්න පිළිබඳව හේතු සොයා බැලීම.

2. මෙම ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධව සහ ඒ සඳහා ඍජු හෝ වක්‍රාකාරයෙන් පරිපාලන හා විධායකයන් කටයුතු කර තිබේද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම.
3. එම උල්ලංගනයන් සිදුවීම වැළැක්වීම හෝ අවම කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙසට වගකිව යුතු ආයතන වෙත නිර්දේශ නිකුත් කිරීම.
4. මාතර දිස්ත්‍රික්කයේ ගංවතුර අවම කිරීම සඳහා කෙටි කාලීන හා දිගු කාලීන යෝජනා හඳුනා ගැනීම.

## 4. මානව හිමිකම් ප්‍රමිතීන්

**මානව හිමිකම් මත ස්වභාවික විපත්වල බලපෑම**

1. **ජීවිතයට සහ සෞඛ්‍යයට ඇති අයිතිය:** භූමිකම්පා සහ ගංවතුර වැනි ස්වභාවික විපත් ඍජුවම ජීවත්වීමේ අයිතියට සහ ආරක්ෂාවට තර්ජනය කරයි. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ (UDHR) 3 වන වගන්තියේ සඳහන් වන්නේ, *"සෑම කෙනෙකුටම ජීවත්වීමට, නිදහසට සහ පුද්ගලයාගේ ආරක්ෂාවට අයිතිය ඇත"* **(**United Nations [UN], 1948) යනුවෙනි.
2. **ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් සඳහා ඇති අයිතිය:** ආපදා මගින් අත්‍යවශ්‍ය සේවා කඩාකප්පල් කිරීම, ජලය අපවිත්‍ර කිරීම සහ ආහාර ප්‍රභවයන් විනාශ කිරීම, සෞඛ්‍යයට සහ යහපැවැත්මට බලපෑම් ඇති කරයි. එය ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් සඳහා ඇති අයිතිය පිළිගන්නා මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 25 වැනි වගන්තිය උල්ලංඝනය කිරීමකි(UN, 1948).
3. **ඉහළම සෞඛ්‍ය ප්‍රමිතිය:** ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICESCR) 12 වැනි වගන්තිය මගින් ලබා ගත හැකි ඉහළම කායික හා මානසික සෞඛ්‍ය ප්‍රමිතිය සඳහා ඇති අයිතිය පිළිගනී(UN General Assembly, 1966). සෞඛ්‍ය සේවා පද්ධති යටපත් වී වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශය සීමා වූ විට එය සම්මුතියේ සඳහන් අයිතීන් යටපත් කිරීමකි.
4. **තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs):**

    I. **ඉලක්කය 3 (යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම):** සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහතික කිරීම සහ සෑම වයස් කාණ්ඩයකම සැමට යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. ස්වාභාවික විපත් මගින් සෞඛ්‍ය සේවා පද්ධති යටපත් කර බෝවන රෝග ඇතිවීමේ අවදානම වැඩි කළ හැකි අතර, මෙම ඉලක්කයේ වැදගත්කම ඉස්මතු කරයි.

    II. **ඉලක්කය 6 (පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව):** පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය සහතික කිරීම රෝග වැළැක්වීම සහ ව්‍යසනයන්හිදී සෞඛ්‍යය පවත්වා ගැනීම සඳහා ඉතා වටී.

**1978 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද ශ්‍රී ලංකාව තුළ සිටින පුද්ගලයින් සහ පුරවැසියන්ගේ හිමිකම් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඇත. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් යටතේ පහත වගන්ති කෙරෙහි අවධානය යොමු කර ඇත (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978).:

1. **වගන්ති අංක 12 (1):** සියලුම පුද්ගලයන් නීතිය ඉදිරියේ සමාන පුද්ගලයන් වන අතරම නීතියේ සමාන ආරක්ෂාව රැකවරණය ලැබීමට හිමිකම් කියනු ලබයි.
2. **වගන්ති අංක 12 (2):** කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර හෝ හේතුවක් මත හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේය.
3. **වගන්ති අංක 14 (1) (උ):** එකලාව හෝ අන් අය සමග යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හා ව්‍යවසායක නියුක්ත වීමේ නිදහස තහවුරු කරයි.
4. **වගන්ති අංක 14 (1) (ඌ):** මගින් ගමන් කිරීමේ සහ අභිමත ස්ථානයක වාසය කිරීමේ අයිතිය සහතික කරයි.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙම ගැටලුවට මැදිහත් වෙන්නේ ඇයි?**

ශ්‍රී ලංකා රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදය මගින් සහතික කොට ඇති මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරනු වස් පාර්ලිමේන්තුව මගින් සම්මත කොට පිහිටුවා ඇති 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් එකී කාර්යභාරයන් හා බලතල ලබා දී ඇත (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත, 1996).

වගන්ති අංක 14 අනුව කොමිෂන් සභාව විසින් එහි මෙහෙයවීමෙන් අතෘප්තියට පත් තැනැත්තෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය කිරීම පිළිබඳ ගැටලුවක් විමර්ශනය සිදු කරනු ලබයි. ඒ අනුව මූලිකවම ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවේ පර්යේෂණ හා අධීක්ෂණ අංශය මගින් සිදුකරන මාධ්‍ය අධීක්ෂණ කාර්යය තුළදී මාතර **දිස්ත්‍රික්**කයට බලපාන ලද මෙම ගංවතුර ආපදා තත්ත්වය පිළිබඳ මැදිහත් විය යුතු බවට මූලිකව හඳුනා ගන්නා ලදී. ඒ අතර කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත වින්දිත පාර්ශවයන් නියෝජනය කරමින් පැමිණිලි 2ක් ඉදිරිපත් විය. එම පැමිණිලිවල අඩංගු කරුණු ද සලකා මෙම අධ්‍යයනය සිදුකරන ලදී.

**5. නිල්වලා ගඟ ආශ්‍රිතව සිදුව ඇති ගංවතුර පාලන සහ සංවර්ධන වැඩසටහන්**

ඓතිහාසික නිල්වලා නිම්නය ගංවතුර ආපදාවෙන් පීඩා විඳින කලාපයක් බැවින් පසුගිය සියවස දෙවන භාගයේ රජයේ විශේෂිත නිල්වලා ගඟ ආශ්‍රිත ගංවතුර පාලනය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

1. **ජල පිරිපහදු තුඩුමුඛවල් සැකසීම:** 1963 වර්ෂයේදී ගංගා මෝයේ සිට කි.මී. 10 ක දුරින් නාදුගල ප්‍රදේශයෙන් ද, 1983 වර්ෂයේ ගං මෝයේ සිට කි.මී. 18 ක දුරින් කද්දුව ප්‍රදේශයෙන් ද, 1998

වර්ෂයේ ගං මෝයේ සිට කි.මී. 24ක දුරින් පවිත්‍රාගාර සඳහා ජලය ලබා ගන්නා තුඩුමුඛවල් සකස් කර ඇත. මේ මගින් වියළි කාලයේදී ගංගා ජලයට ලවණ ජලය මිශ්‍ර වීම වැළැක්වීම සිදුවේ.

2. **නිල්වලා ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘතිය (1989):** නිල්වලා ගඟේ පහළ නිම්නය සහ මාතර නගරය ගංවතුරින් ආරක්ෂා කිරීම සඳහා 1989 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ස්ථාපිත කර ඇත. එම ව්‍යාපෘතිය යටතේ පහත යෝජනා ඉදිරිපත් වී ඇත: පොම්පාගාර ක්‍රියාත්මක කිරීම, ආරක්ෂණ බැම් ඉදිකිරීම, නිල්වලා ගඟේ ප්‍රධාන අතු ගංගා ආශ්‍රිතව කුඩා කුඩා වැව් ඉදිකිරීම, පහළ නිම්නයේ ජලය ඉක්මනින්ම මුහුදට යැවීම සඳහා ඇළ මාර්ග රාශියක් ඉදිකිරීම. ඒ අනුව ඉහත සඳහන් යෝජනා අතුරින් අකුරැස්ස නගරයෙහි පහළ ප්‍රදේශය කොටස් තුනකට බෙදා එක් එක් ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා ඉන්ධන මගින් ක්‍රියාත්මක වන පොම්ප 24 කින් සමන්විත පොම්පාගාර තුනක් ස්ථාපිත කර ඇත.
3. **තාවකාලික ලවණ බාධක (2012):** 2012 වර්ෂයේ සිට ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය විසින් වියළි කාලයේදී ගංගා ජලයට ලවණ ජලය මුසුවීම වැළැක්වීම සඳහා බණ්ඩත්තර ප්‍රදේශයේදී වැලි කොට්ට ආධාරයෙන් තාවකාලික ලවණ බාධකයන් ඉදිකරන ලදී.
4. **ස්ථිර ලවණ බාධක නිර්මාණය:** වැලි කොට්ට ආධාරයෙන් තාවකාලික ලවණ බාධකයන් ඉදිකිරීමේ පවතින ප්‍රායෝගික අපහසුතාවයන් නිසා ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා වූ සැලැස්මක් ලෙස ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය විසින් මෝය කටේ සිට 5 KM ඉහළින් ගේට්ටු 5 කින් සමන්විත ලවණ බාධක නිර්මිතයක් ඉදිකරන ලදී.
5. **ගිවිසුම්ගත වීම සහ තාක්ෂණික දත්ත (2015):** 2015 වර්ෂයේ ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය නිල්වලා ගඟ ආශ්‍රයෙන් ක්‍රියාත්මක කරනු ලබන පානීය ජලය ලබාදීමේ IV ජලසම්පාදන යෝජනා ක්‍රමය යටතේ ලවණ බාධකය ඉදිකිරීම සඳහා ලංකා හයිඩ්‍රොලික් සමාගම සමග ගිවිසුම්ගත වී ඇත. ලවණ බාධකය ඉදිකිරීමට පෙර හයිඩ්‍රොලික් සමාගම විසින් ක්ෂේත්‍ර අධ්‍යයනයක් 2015-2016 වර්ෂවල සිදුකර ඇති අතර 2017 වර්ෂයේ ලංකා හයිඩ්‍රොලික් සමාගම ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමෙන් පසුව කොරියානු සමාගමක් විසින් ඉදිකිරීම් කටයුතු සිදු කොට ඇත. එම අධ්‍යයනයෙන් අනතුරුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර අනුමැතිය ලබා දී ඇත.
6. **ලවණ බාධක ඉදිකිරීම් තාක්ෂණික දත්ත:** දොරටු ගණන - 05, ගේට්ටුවේ විශාලත්වය - 10 m x 3.1 m, ව්‍යුහයේ ඉහළම මට්ටම - -2.5m MSL, ගේට්ටුවක් වැසූ විට ඉහළම මට්ටම - + 0.6m MSL, ව්‍යුහයේ සම්පූර්ණ පළල = 54 m සහ ගේට්ටු රහිත විවරය - 02.

## 6. තොරතුරු හා දත්ත එකතු කිරීමේ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේදී ප්‍රාථමික හා ද්විතීක ක්‍රමවේදයන් දෙකම භාවිත කරන ලදී. අධ්‍යනයේ පරමාර්ථය පදනම්ව පර්යේෂණ ගැටලුව හඳුනා ගැනීම සඳහා සාහිත්‍ය සමාලෝචනය පවත්වන ලදී.

1. **ද්විතීක දත්ත මූලාශ්‍ර:** පුවත්පත්, ලිපි, මාධ්‍ය වාර්තා, මෙතෙක් වගකිවයුතු ආයතන විසින් මේ සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡාවලට අදාළ කාර්ය සටහන් සහ යූ ටියුබ් නාලිකා තුළ පළ වූ වාර්තා වැඩසටහන් ආදියයි. මෙම පර්යේෂණ ගැටලුව තාමත් නොවිසඳී ඇති බැවින් විවිධ පාර්ශවයන් දිනෙන් දින මාධ්‍ය හරහා තම අදහස් පළ කරනු ලබයි.

2. **කැඳවුම් සාකච්ඡා:** අධ්‍යයනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජයේ වගකිව යුතු ආයතන හා ගොවි සංවිධානවල නියෝජිතයන් කොමිෂන් සභාව වෙත කැඳවා සාකච්ඡා පවත්වන ලදී. එහිදී ගංවතුර හේතුවෙන් ගොවීන් මුහුණ දෙන ගැටලු පිළිබඳව සාකච්ඡා කරන ලදී.
3. **පළමු ක්ෂේත්‍ර චාරිකාව:** මෙම අධ්‍යයනයේදී ලවණතා බාධකය, නාදුගල තුඩාව, මාගල්ලගොඩ බණ්ඩත්තර, කඩවැද්දුම අදෙලෙද්දුව හා තලවත්තේගොඩ යන ප්‍රදේශයන්වල කොමිෂන් සභා නිලධාරීන් විසින් ක්ෂේත්‍ර චාරිකා කරන ලදී. මෙම ක්ෂේත්‍ර චාරිකාව සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ නිලධාරීන් මෙන් ම සිවිල් සංවිධානවල සාමාජිකයන් ද එක් විය.
4. **දෙවන ක්ෂේත්‍ර චාරිකාව (2023 මාර්තු 16):** පර්යේෂණය මත පදනම්ව 2023 මාර්තු 16 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තවත් ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී. එම අධ්‍යයනයේ දී නිරීක්ෂණය වූ ස්ථාන වූයේ, ලවණතා බාධකය, ලවණ බාධකයෙන් වැලි කොට්ට ඉවත් කරමින් සිටි ස්ථානය, නාදුගල, තුඩාව, මාගල්ලගොඩ, බණ්ඩත්තර, කඩවැද්දුම, අඩලේද්දුව, සහ තලවත්තේගොඩ යන ප්‍රදේශත් මෙන්ම ඕලන්ද ඇළත් වේ. මෙම ක්ෂේත්‍ර චාරිකාව සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා ගොවි සංවිධාන නියෝජිතයින් සහභාගී විය.
5. **ප්‍රධාන කාර්යාල සාකච්ඡාව (2024 අප්‍රේල් 18):** උක්ත ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් ලබා ගත් දත්ත පදනම් කරගනිමින් සිවිල් සංවිධාන හා රාජ්‍ය ආයතන සමග 2024 අප්‍රේල් මස 18 වන දින සාකච්ඡාවක් මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි. මෙහිදී අනාවරණය වූ කරුණු අනුව මාතර ගංවතුර තත්ත්වයට හේතුව ලවණ බාධකය සේම තවත් හේතු රැසක් පවතින බව අනාවරණය විය.

## 7. සිවිල් සංවිධාන සහ ගොවි සංවිධාන නියෝජිතයන්ගේ මතය

ගංවතුර තත්ත්වයන් ඇතිවීමට හා බැස නොයෑමට බලපා ඇති හේතු ලෙස මාතර දිස්ත්‍රික් ගොවි සංවිධාන නියෝජිතයන් සහ සිවිල් සංවිධාන පෙන්වා දෙන කරුණු මෙසේය:

1. **පොම්පාගාරවල වයස සහ පිරිවැය:** 1989 දි නිල්වලා ගංවතුර ආරක්ෂක ව්‍යාපෘතිය යටතේ පොම්පාගාර තුනක් ඉදිකිරීමට යෝජනා වීමත් සමග පිහිටුවූ තුඩාව, මාගල්ලගොඩ පොම්පාගාර වසර 30 - 40 ක පැරණි ඒවා වේ. මේ නිසා ඒවායේ කාර්යක්ෂමතාවය අඩු වී ඇති බැවින් වර්තමානයේ බලාපොරොත්තු වන කාර්යක්ෂමතාවයෙන් හා අපේක්ෂිත විභවතාවයකින් යුතුව ක්‍රියා කිරීමට නොහැකි වී ඇත. මෙම සියලුම පොම්පාගාර ධාවනය වන්නේ ඉන්ධන මත වන බැවින් අධික පිරිවැයක් දැරීමට සිදු වේ. සාමාන්‍යයෙන් දිනකට දළ වශයෙන් මිලියන 8 ක් පමණ වැයවන බැවින්, එවැනි කාර්යක්ෂමතාවය වැඩි කිරීමට නම් අමතර පිරිවැයක් දැරීමට ද සිදුවනු ඇත. මෙම තත්ත්වය ද මාතර ප්‍රදේශයේ ගංවතුර බැස නොයෑමට ප්‍රධාන හේතුවකි.
2. **ඕලන්ද ඇළ සහ පැරණි වාරි පද්ධති වසා දැමීම:** ගංවතුර බැසයාමට හා කෘෂිකර්මාන්තය පුළුල් කිරීම සඳහා ජලය සැපයීමට ලන්දේසි යුගයේ ඉදිකරන ලද ඕලන්ද ඇළ වර්තමානය වන විට වසා දමා ඇති බැවින් වැඩි වතුර ගලා යාමේ දුෂ්කරතා පැන නැගී ඇත. ඒ අනුව ජල බැස්මේ කළමනාකරණය සඳහා අතීත මිනිසුන් භාවිතා කළ විවිධ ඇළ මාර්ග හා අමුණු වර්තමානයේ සංවර්ධනය වේගවත් වීමත් සමගම වසා දැමීමට හෝ ඒවයේ විශාලත්වය අඩුවීමට ලක්ව ඇත.

මෙලෙස කළමනාකරණය නිසි අයුරින් සිදු නොවීම ද ගංවතුර තත්ත්වය පහව යෑමට බලපා ඇති තව එක් හේතුවකි.

3. **දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉදිකිරීම්:** දක්ෂිණ අධිවේගී මාර්ගය ශ්‍රී ලංකාවේ පළමු පංතියේ අධිවේගී මාර්ගය වන අතර එය කොළඹ, ගාල්ල සහ මාතර වැනි ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන සම්බන්ධ කරයි. මාතර ගංවතුර ගැටලුවට එක් හේතුවක් ලෙස අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් හේතුවෙන් පහත්බිම්වල ජලය බැසයෑමේ ක්‍රියාවලියට බාධා පැමිණවීම සිදුව ඇති බව ඔවුන් ප්‍රකාශ කරයි.
4. **තාක්ෂණික උපදෙස් නොපිළිපැදීම:** මාතර නිල්වලා ගඟ හරස් කරමින් ඉදිකළ ලවණ බාධකය නිසා ගඟෙහි හරස්කඩ ප්‍රමාණය අඩුවිය හැකි බවට මධ්‍යම පරිසර අධිකාරිය ලබා දී ඇති තාක්ෂණික උපදෙස් පිළිපැදීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොමැති බැවින් මෙවැනි තත්ත්වයන් ඇති වී ඇත. තවද ගංවතුර තත්ත්වය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, එම තත්ත්වය පාලනය කිරීම සඳහා කඩා හැලෙන ගේට්ටු සවිකළ යුතු බව මධ්‍යම පරිසර අධිකාරිය උපදෙස් ලබා දී ඇති මුත් එම උපදෙස් අනුව ස්වයංක්‍රිය ලෙස ක්‍රියාත්මකවන දොරටු ඉදිකිරිමට කටයුතු සිදුකර නොමැත.
5. **ෂීට් පයිල් (Sheet pile) සවිකිරීම:** බාධකය ඉදිකිරීමේ දී ගඟේ ගැඹුර අඩු කර ගඟට ලවණ ජලය මිශ්‍රවීම වැළැක්වීමට ෂීට් පයිල් (Sheet pile) සවිකිරීම වැඩි ජලය බැස නොයෑමට හේතු වී ඇත.

## 8. වගකිවයුතු රාජ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ලද කරුණු

### 8.1. ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය

I. මාතර ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය පානීය ජලය සැපයීම එම ආයතනය මගින් සිදු කරන බවත්, වියළි කාලයේදී ගංගා ජලය, ලවණ මිශ්‍ර ජලය සමග එකතු වීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගන්නා බවත් දක්වා ඇත. මෙලෙස ලවණ ජලය මිශ්‍රවීම වැළැක්වීම සඳහා ලවණ බාධකය ඉදිකිරීම වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමග අවබෝධතා ගිවිසුමක් මගින් ගිවිසුම්ගත වී ඇත. ඒ අනුව 2017 වර්ෂයේ දී ඉදිකිරීම් ආරම්භ කර 2022 වර්ෂයේ ඉදිකිරීම් අවසන් කර ඇත.

II. 2023 වර්ෂයේ ඇතිවූ ගංවතුර තත්ත්වයට යම් ආකාරයකින් මෙම ඉදිකිරීම හේතු වූ බවට බොහෝ පිරිසකගෙන් චෝදනා පැමිණි බව ද කියා සිටී. එහිදී ඇති වූ ජල තත්ත්වය පාලනය කිරීම සඳහා ලවණ බාධකයේ සියලුම ජල පාලන ගේට්ටු විවෘත කිරීමට පවා සිදුවූ බව ද ප්‍රකාශ කරයි.

III. ගංවතුර නිසා සිදු වූ වගා හානි හේතුවෙන් ගොවියන්ට රුපියල් ලක්ෂ 7 ක වන්දි ගෙවීම් සිදුකර ඇති බවත්, ජීවිතය නඩත්තු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීමට පවා සිදුවූ බවත් කියා සිටී.

IV. ගංවතුර තත්ත්වය ඇතිවීමට, ලවණ බාධකය ඉදිකිරීම නිසා නිසිලෙස වතුර බැසයාමට බාධා ඇතිවීම බලපෑ බව පවසන අතර, ගොවි සංවිධායකයින්ගේ හා ප්‍රාදේශීය බලධාරීන්ගේ ඉල්ලීම මත ලවණ බාධකය තුළ සවිකර තිබූ sheet pile අඩි 40ක පමණ දුර ප්‍රමාණයක් ගලවා ඉවත් කර ඇත.

V. ලවණ බාධකය ඉදිකිරීමට ප්‍රථම භාවිත කළ තාවකාලික ලවණ බාධකයේ වැලි ඉවත් කිරීම සම්පූර්ණයෙන්ම සිදු වී නොමැති බැවින් එය නැවත සිදු කිරීම සඳහා ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ ආයතනය වෙත කොන්ත්‍රාත්තුවක් ලබා දී ඇත.

VI. ලවණ බාධකයේ වම් ඉවුරේ ඉහළින් හා පහළින් මීටර් 50 ජලනල එළීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට මූලික පියවර ගෙන ඇති බවත්, ලවණ බාධකය ඉදිකිරීම හේතුවෙන් සිදුවන

බලපෑම් අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දක්වා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා කැබිනට් පත්‍රිකාවක් (පිටපතක් සහිතව) යොමු කර ඇති බව ද කියා සිටී.

**8.2.** වාරිමාර්ග දෙපාර්තමේන්තුව

I. ලවණ බාධකය ඉදිකිරීම නිසා මතුවූ අවහිරතා සම්බන්ධයෙන් ගොවීන්ගෙන් පැමිණිලි ලැබීම හේතුවෙන්, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලද අතර ඒ අනුව නැවත ගඟෙහි පවතින තත්ත්වය පිළිබඳ අධ්‍යයනයන් සිදුකළ යුතු බවට එකඟතාවයක් පැවතිය ද එම තත්ත්වය සිදු වී නොමැති බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශ කර සිටී.

II. එනම් පෙර ජල විද්‍යා අධ්‍යයනය සිදුකරන ලද ආයතනය විසින්ම එය කිරීම නුසුදුසු බැවින් තෙවන පාර්ශවයක් ලවා සිදු කළ යුතු බවට වාරිමාර්ග අමාත්‍ය හා අනෙකුත් නිලධාරීන් සමඟ කළ සමීක්ෂණයේදී තීරණය වුව ද නැවතත් එම අධ්‍යයනය ලංකා හයිඩ්‍රොලික් සමාගම වෙතම පවරා ඇත.

III. දැනට ලවණ බාධකය ඉදිකිරීම නිසා උත්ගත වී ඇති තත්ත්වයන් නිසා බලපෑමක් ඇති කරන බව පෙනී යන බව දන්වන ලදී. දැනට පවතින ගංගා පතුලේ මට්ටම වෙනස් නොකර තවත් ගේට්ටු එක් කිරීම මගින් ජලය පිටාර ගැනීම 50% කින් පමණ අඩු කිරීම සිදු කළ හැකි බව ප්‍රකාශ කරයි.

IV. ගංගා ද්‍රෝණි අධ්‍යයනයක් සිදු කළයුතු බවත් ජල භූ විද්‍යා සම්බන්ධ විශේෂඥයින් යොදවා අධ්‍යයනයක් සිදු කර ඔවුන්ගේ නිර්දේශ ලබා ගැනීම සුදුසු බවත්, ගං පතුලේ තැන්පත්ව ඇති රොන්මඩ ඉවත් කිරීම, පොම්පාගාර කාර්යක්ෂමව යථාවත් කිරීම ආදී ක්‍රියාමාර්ග ගැනීම තුළින් ගංවතුර තත්ත්වය නිසා ජනතාවට එල්ලවන තර්ජනයන් මඟහරවා ගත හැකි බව කියා සිටී.

**8.3.** මධ්‍යම පරිසර අධිකාරිය

I. පරිසර බලපෑම් ඇගයීම් අධ්‍යයනයකින් අනතුරුව 2017/10/11 වන දින ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය වෙත ඇගයීම් වාර්තාව ලබා දුන් බවත්, එහි කොන්දේසි අතර අංක 1.5 යටතේ ව්‍යාපෘතියේ ආරම්භය මධ්‍යම පරිසර අධිකාරිය වෙත දැනුම් දිය යුතු වුවත්, එවැන්නක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් තම ආයතනය වෙත දැනුම්දීමක් සිදුනොකළ බව කියා සිටී. මෙහි ආරම්භක අවස්ථාවේදී ම ජනතාව විසින් කරන ලද පැමිණිල්ල හේතුවෙන් එහි වැඩ ආරම්භ කර ඇති බව දැනගත් බව කියා සිටී.

II. ගොවීන්ගේ පැමිණිලි සම්බන්ධව යොමු කොට ගොවි සංවිධාන හා නිලධාරීන් සමඟ සාකච්ඡා වට කිහිපයක් ද සිදුකරන ලද බවත්, ලවණ බාධකය නිසා ඇතිවී ඇති ගැටලු නිරාකරණය කිරීම හා ඒ සඳහා යන වියදම් පිළිබඳ සොයා බැලීමට කමිටුවක් පත් කර ඇති බව ද දන්වයි. එම කමිටුව විසින් ස්ථාන පරීක්ෂාවන් සිදු කළ අතර එහි නිර්දේශ මේ වනවිට නිකුත් කර ඇති බව කියා සිටී.

III. එහි දී නිල්වලා ගඟේ සහ එහි අතු ගංගාවල රක්ෂිතයන් නිසි ලෙස පවත්වාගෙන යාම, LHI අධ්‍යයනයේ සොයා ගැනීම් තහවුරු කර ගැනීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට මෙන් ම නිල්වලා ගංගා ද්‍රෝණියම ආවරණය වන ලෙස ගඟේ ජල මට්ටම මැනීම සඳහා සුදුසු ස්ථාන හඳුනාගෙන මැනුම් ස්ථාන ස්ථාපිත කරමින් නිසි පරිදි දත්ත එක් රැස් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම පිළිබඳව අවධානය යොමුව ඇති බව වැඩිදුරටත් කියා සිටී.

### 8.4. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

I. මාතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවල නාගරික ලක්ෂණ සහිත ප්‍රදේශ හඳුනාගෙන ඒවා සංවර්ධන ප්‍රදේශ ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම හා සංවර්ධන සැලසුම් සකස් කිරීම සිදු කරනු ලබන බව කියා සිටී. එම සැලසුම් අදියර 10 ක් යටතේ ක්‍රියාත්මක කිරීම සිදු කරන අතර තුන්වන අදියර යටතේ ප්‍රදේශයේ පවතින ගැටලු හා විභවතා හඳුනා ගැනීම සිදුකරන බවත් ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග ගැනීම සිදු කරන අතරම දත්ත විශ්ලේෂණයන් සිදු කරන බව ද කියා සිටී. ප්‍රදේශයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නියෝජනය කරමින් රැස්වීම් සංවිධානය කරමින් තොරතුරු සකස් කිරීම කරනු ලබයි.

II. ඒ අනුව නිල්වලා ගඟේ වැඩිම ජල ගැලීම් තත්ත්වයන් වාර්තා වූ තිහගොඩ හා මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඇතුළත් වන සේ මෙම අධිකාරිය මගින් මාතර නාගරික සංවර්ධන සැලැස්මක් සිදු කර ඇති බවත් එමගින් ගංවතුර ආපදා තත්ත්වය අවම කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කර ඇති බව කියා සිටී:

   a. සංවර්ධන සැලැස්ම මගින් ඉඩම් භාවිතා කලාප සැලැස්මක් සකස් කිරීම.
   b. එකී සැලැස්ම යටතේ දැනට පවත්නා කුඹුරු හා පහත් බිම් ජලය රඳවා ගැනීමට හැකිවන පරිදි සංවර්ධන කටයුතුවලට බාධා කිරීමකින් තොරව සංරක්ෂිත කලාප නම් කිරීම.
   c. නිල්වලා ගඟ දෙපස මීටර් 10.0 ක ගොඩනැගිලි සීමාවක් තැබීම.
   d. ගඟට සම්බන්ධ සියලුම ඇළ මාර්ග සඳහා ඒවායෙහි පළල අනුව රක්ෂිතයන් තැබීම.
   e. වැසි ජල රැඳවුම් ටැංකි ඉදිකිරීම වැනි ක්‍රියාමාර්ග ගැනීම.

### 8.5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර

I. මාතර දිස්ත්‍රික්කයට බලපානු ලබන ගංවතුර තත්ත්වයට ලවණ බාධකය පමණක් බලනොපාන බවත් ස්වභාවික සංසිද්ධීන් දෙකෙහි ම බලපෑම් අඩු වැඩි වශයෙන් පවතින බව කියා සිටී.

II. එම තත්ත්වය අවම කිරීම සඳහා බණ්ඩත්තර පාලමට මීටර් 100ක් පමණ ඉහළින් 2016 ඉදිකරන ලද තාවකාලික ලවණ බාධකයේ වැලි සම්පූර්ණයෙන්ම ඉවත් නොවීම නිසා ඒවා ඉවත් කිරීමට කටයුතු කරමින් සිටින බව පවසයි.

III. නිල්වලා ගඟේ කිරම ආර ගඟ දෙපස වැටී ඇති පස් ඉවත් කිරීම, ගඟ පතුලේ තැන්පත් වී ඇති වැලි ඉවත් කිරීම හා නුපේ ඇළ නොහොත් ඕලන්ද ඇළෙහි මඩදිය හේතුවෙන් පරිසරයට අපවිත්‍ර දෑ මුසුවීම අවම කිරීම, මෙතෙක් පිළිසකර කර නොමැති ඇළ වේලි පිළිසකර කිරීම ආදිය සිදු කිරීම සිදු කළ බව ද කියා සිටී.

### 8.6. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙතින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද වාර්තාව අනුව එම දෙපාර්තමේන්තුව විසින් 2024/02/01 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත එවන ලද වාර්තාව පදනම්ව කරුණු දැක්වීම සිදු කර ඇත. මාතර ප්‍රදේශයට වර්ෂාව ඇදහැලීම සම්බන්ධව වර්ෂ

තුනක එනම් 2003, 2017 හා 2023 හි වැඩිම වර්ෂාපතන වාර්තාවීම් ඇතුළත් කරමින් ලබා දී ඇති වාර්තාවේ සංක්ෂිප්තය පහතින් දැක්වේ:

I. **2003 වර්ෂය:** මැයි මාසය තුළ පතිත වූ වර්ෂාපතනය කෙරෙහි අවධානය යොමු කිරීමේදී මැයි 17 වන දින පැය 24 ක් තුළ වැඩි ප්‍රතිශතයකින් වර්ෂාපතනය සිදු වී ඇත. එදින මිලි මීටර් 730ක් දෙනියාය විලි ගෲප් වතු යායෙන් ද අනින් කන්ද වතු යායෙන් ද මිලිමීටර 300 ඉක්මවූ වර්ෂාපතනයක් වාර්තා වී ඇත.

II. **2017 වර්ෂය:** මැයි මාසය තුළ පදනම් කරගනිමින් වාර්තාව ලබා දී ඇති අතර එහිදී දින තුනක් වැඩි වර්ෂාපතනයක් වාර්තා වී ඇත, එනම් 24, 25 හා 26 දිනවල ලැබී ඇත. එම කාලය තුළදීම අනින්කන්ද වතුයායෙන් මිමී 446 ක් වාර්තා වී ඇති අතර මිමී 300 හා 200 ඉක්මවූ තවත් ස්ථාන දෙකක් ද වාර්තා වී තිබී ඇති බව දක්වා ඇත.

III. **2023 වර්ෂය:** පදනම් කරගෙන ඇත්තේ සැප්තැම්බර් මාසයයි. මෙහිදී මාසය පුරාම වර්ෂාව ඇද හැලීම පැවතී ඇති අතර 25 වන දින සිට මාසය අවසන් වන තුරුම වර්ෂාව ඇද හැලී ඇත. එම වර්ෂාව දෙසැම්බර් මාසය දක්වාම පැවතීමත්, එම මාසවල සාමාන්‍යයට වඩා දෙගුණවීමත් විශේෂත්වයක් ලෙස දක්වා ඇත. 2003 හා 2017 වර්ෂවලදී අධික වර්ෂාව දින 3-4 කට සීමා වුව ද 2023 දී බොහෝ දිනවලදී වර්ෂාව ලැබී ඇති බව පෙන්වා දෙයි.

## 8.7. සීමාසහිත ලංකා හයිඩ්‍රොලික් ආයතනය (LHI)

I. 2015 වර්ෂයේ ජනවාරි මස ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය විසින් (මාතර අදියර IV ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ) ප්‍රධානය කරන ලද කොන්ත්‍රාත්තුවකට අනුව සීමාසහිත ලංකා හයිඩ්‍රොලික් ආයතනය විසින් හයිඩ්‍රොලික් අධ්‍යයනය සහ සංකල්පීය උපදේශන සේවා සිදු කර ඇත.

II. නිල්වලා ගඟ හරහා ලවණ බාධකයේ හයිඩ්‍රොලික් නිර්මාණය පාරිසරික බලපෑම් තක්සේරුව සැලකිල්ලට ගැනීමෙන් මෙම ලවණතා බාධකයේ ඉදිකිරීම් අවසන් කළ බව දක්වා සිටි බව ද, ලවණතා බාධකයේ හයිඩ්‍රොලික් සැලසුම යෝජනා කිරීම සහ අවසන් කිරීම දක්වා ඔවුන් ක්ෂේත්‍ර විමර්ශනයන්, ජල විද්‍යාත්මක හා හයිඩ්‍රොලික් සැලසුම යෝජනා කිරීම සහ ත්‍රිමාණ භෞතික ආකෘති අධ්‍යයනයන් ඇතුළු පුළුල් අධ්‍යයනයක් සිදු කළ බව ද ලංකා හයිඩ්‍රොලික් ආයතනය ප්‍රකාශ කර සිටී. මෙම ඉදිකිරීම 2017 ආරම්භ වී 2020 නිම කිරීමට යෝජිත වුවත් පැමිණි බාධා හමුවේ 2022 වර්ෂයේ නිම කර ඇත.

III. තවදුරටත් මෙම ආයතනය සඳහන් කරන්නේ 2023 වසරේ ගංවතුර තත්ත්වය බැස යාම ප්‍රමාද වීමට මෙම ලවණතා බාධකය ඉදිකිරීමත් යම් තරමකට බලපෑමක් විය හැකි බවයි.

IV. IGCT to LHI අධ්‍යයනය සිදු කිරීම සඳහා නිල්වලා ගඟ හරහා ඇති ලවණතා බාධකයේ හයිඩ්‍රොලික් සැලසුම නැවත තක්සේරු කිරීම වලංගුභාවයට පත් කිරීම සිදු වුණ බව කියා සිටී. ඒ අනුව ඔවුන් මේ වනවිට වාර්තාව සකස් කරමින් සිටින බව පවසයි. මෙම අධ්‍යයනයේදී ජල විද්‍යාත්මක විශ්ලේෂණ, සංඛ්‍යාත්මක ආකෘති සමාකරණ (වර්ෂාපතනය ගලායන ආකෘති 1D සහ 2D හයිඩ්‍රොලික් ආකෘති) විවිධ ගංවතුර තත්ත්වයන් සඳහා ලවණතා බාධකයන් රහිත සහ සහිත ගංවතුර ජල ගැලීම් සිතියම් සංවර්ධනය යනාදිය අවසානයේ දී ඔවුන් අපේක්ෂා කරන බව වැඩිදුරටත් එම ආයතනය දක්වා සිටී.

# 2 වන කොටස

## මානව හිමිකම් උල්ලංඝනය වීම් සහ ජනතා පීඩාවන් පිළිබඳව නිරීක්ෂණ

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මාතර දිස්ත්‍රික්කයේ ප්‍රදේශ කීපයකට ඇති වූ ගංවතුර තත්ත්වය නිසා එහි වෙසෙන ජනතාවගේ එදිනෙදා ජන ජීවිතයට බාධා පැමිණීම නිසා ඇති වූ මානව හිමිකම් උල්ලංඝනය වීම් සහ ජනතා පීඩාවන් පිළිබඳව පැතිකඩයන් කිපයක් ඔස්සේ නිරීක්ෂණය කරන ලදි. එනම්,

### 1. ගංවතුර නිසා සිදුවූ සමාජීය, ආර්ථික හා කෘෂිකාර්මික හානිය

1. 2023 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රදේශ කීපයකට ඇති වූ ගංවතුර තත්ත්වය නිසා එහි වෙසෙන ජනතාවගේ එදිනෙදා ජන ජීවිතයට බාධා පැමිණි බව නොරහසකි.
2. එවැනි තත්ත්වයන් ඇති වීමට කිසියම් හෝ රාජ්‍ය ආයතනයක ක්‍රියාකාරීත්වය හෝ ගන්නා ලද තීරණයන් ඉවහල් වී ඇතිද යන්න කොමිෂන් සභාව විසින්ම හා කොමිෂන් සභාව වෙත ගොනු කරන ලද පැමිණිලි දෙකක්ද පදනම් කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කොට ඇත.
3. සිදු වී ඇති හානි අතර කඩවද්දුව, කිරලකැලේ සහ ආඬේලෙද්දුව යන ප්‍රදේශවල කුඹුරු අක්කර ගණනාවක් පුරන් වී ඇති බව නිරීක්ෂණය විය.
4. 2023 දී ප්‍රදේශයට ඇති වූ ගංවතුර හේතුවෙන් අනෙකුත් වගාවන් රැසක් ද විනාශ වී ඇති අතර, වැඩි කාලයක් ගංවතුර එකතැන පල්වීම හේතුවෙන් අස්වනු සියල්ල ද විනාශ වී ඇත.
5. බොහෝ ජලාපවහන කාණු සහ ජලමාර්ග පවා කසළ බැහැර කිරීම සහ ඉඩම් ගොඩකිරීම් හේතුවෙන් අවහිර වී ඇති බවක් දක්නට ලැබුණි.
6. කිරලකැලේ ප්‍රදේශයේ ලන්දේසි ඇළ ගොඩකිරීම නිසා ජලය ගලායාම අවහිර වී තිබෙනු ක්ෂේත්‍ර අධ්‍යයනයේදී දක්නට ලැබිණි.
7. මේ වන විට මෙම ජල මාර්ගය විනාශ වීම හේතුවෙන් විශාල ජල ප්‍රමාණයක් එකතු වී ඇති බව නිරීක්ෂණය විය.
8. ජලාපවහනය සඳහා පවතින ප්‍රධාන කාණුව වගකීම් විරහිතව වසාදැමීම පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සහ මාතර මහනගර සභාවට පැහැදිලි අවබෝධයක් නොමැති බව පැහැදිලි විය.

### 2. නිල්වලා ගඟේ වැදගත්කම සහ පානීය ජල සැපයුම

1. සිංහරාජ කඳුවැටියේ දකුණු පසින් පිහිටි කෝනගල කන්ද මතින් ආරම්භ වන නිල්වලා ගඟ කිලෝමීටර් 81 ක දිගින් යුක්ත වන අතර, එය මාතර තොටමුණ ප්‍රදේශයෙන් මුහුදට සම්බන්ධ වේ.
2. අතීතයේ සිටම නිල්වලා ගඟෙන් පෝෂණය වූ කෘෂිකර්මාන්තයක් පැවති අතර, ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතා සපුරා ගන්නා ලද්දේ ද නිල්වලා ගඟෙනි.
3. ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය විසින් වාර්ෂිකව ලක්ෂ අටක පමණ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සඳහා නිල්වලා ගඟෙන් ජල ඝන මීටර මිලියන 40 ක් පමණ ලබා ගනී.

4. මේ මඟින් මාතර දිස්ත්‍රික්කයේ මාතර, මිරිස්ස, දෙවිනුවර, දික්වැල්ල, ගන්දර, කුඩාවැල්ල, මාලිම්බඩ, කඹුරුපිටිය, තිහගොඩ හා යටියන යන ප්‍රදේශවලටත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත හා තංගල්ල යන ප්‍රදේශවල ජනතාවටත් අවශ්‍ය පානීය ජල සැපයුම සිදු කරනු ලබයි.

### 3. ලවණ බාධකයේ ඉතිහාසය සහ ව්‍යාපෘති පසුබිම

1. නිල්වලා ගඟෙහි ජලය පිරිසිදු කර ජනතාවට ලබා දීම සඳහා 1983 වර්ෂයේදී ගංගා මෝයේ සිට කිලෝමීටර් 10 ක් දුරින් නාදුගල ප්‍රදේශයෙන් ද, 1998 වර්ෂයේදී කිලෝමීටර් 18 ක් දුරින් කද්දුව ප්‍රදේශයෙන් ද, සහ කිලෝමීටර් 24 ක් දුරින් පවිත්‍රාගාර සහ එහි ජලය ලබා ගන්නා තුඩුමුවවල් ඉදිකිරීම් කර ඇත.
2. මෙමඟින් අපේක්ෂා කරනු ලබන්නේ වියළි කාලයන්හිදී ලවණ මිශ්‍ර ජලය (කරදිය) ගංගා ජලය හා මිශ්‍ර වීම අවම කිරීම වේ.
3. කෙසේ වෙතත්, ගංගා ජලයට ලවණ මිශ්‍රවීම සම්බන්ධයෙන් විවිධ ක්‍රියාමාර්ග ගත්තද එයට නිසි විසඳුම් නොලැබීම හේතුවෙන් 2012 වර්ෂයේදී තාවකාලික විසඳුමක් ලෙස වැලි කොට්ට යොදා නිල්වලා ගඟ හරස්කොට තාවකාලික බැම්මක් ඉදිකර ඇත.
4. ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය විසින් 2021.02.01 දිනැතිව එවන ලද ලිඛිත දේශනයේ සඳහන් වන්නේ, වියළි කාලවලදී ජලයට ලවණ මිශ්‍ර වීම වැළැක්වීමට මින් පෙර ගත් තාවකාලික පියවරයන් දිගුකාලීන විසඳුම් නොවන බැවින් ස්ථිර වශයෙන් ලවණ බාධකයක් ඉදිකිරීමට තීරණය කළ බවයි.
5. ස්ථිර ලවණ බාධකය ඉදිකිරීම, නිල්වලා ගඟ ආශ්‍රයෙන් ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන පානීය ජලය ලබා දීමේ "IV ජල සම්පාදන යෝජනා ක්‍රමයට" අදාළව යෝජනා වී ඇත.
6. ඒ අනුව 2015 වර්ෂයේදී ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය විසින් මෙම ලවණ බාධකය ඉදිකිරීම සඳහා "ලංකා හයිඩ්‍රොලික්" සමාගම සමඟ ගිවිසුම්ගත වී ඇති අතර, ලවණ බාධකය ඉදිකිරීමට පෙර එම සමාගම විසින් 2015-16 වර්ෂවලදී විශේෂ අධ්‍යයනයක් සිදු කොට ඇත.
7. ලවණ බාධකය ඉදිකිරීම සඳහා ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇති අතර, කොරියානු සමාගමක් විසින් 2017 වර්ෂයේ මෙහි ඉදිකිරීම් ආරම්භ කර 2022 වර්ෂයේදී නිම කොට ඇත.
8. සත්‍ය වශයෙන්ම මෙය නිම කිරීමට ගිවිසුම්ගතව තිබුණේ 2020 වර්ෂයේදී වුවද, එකල පැවති වසංගත තත්ත්වය (Covid-19) හේතුවෙන් ඇති වූ බාධාවන් නිසා නිම කිරීම ප්‍රමාද වී ඇත.
9. මෙම ලවණ බාධකයේ උස මීටර් 11 ක් වන අතර පළල මීටර් 54 කි. මෙහි දොරටු 5 ක් වන අතර එක් දොරටුවක පළල මීටර් 10 කි.
10. කරදිය හා මිරිදිය ජලය මිශ්‍ර වීම වැළැක්වීම පිණිස ලවණ බාධකයේ වම්පස ඉවුර ආශ්‍රිතව අඩි 40 ක පමණ දුර ප්‍රමාණයක් sheet pile (යකඩ තහඩු වැටවල්) යොදා ආවරණය කර ඇත.

### 4. සැලසුම්කරණයේ දෝෂ සහ පූර්ව අධ්‍යයනවල දුර්වලතා

1. නිල්වලා ගඟ පිටාර ගැලීමට හේතු වූයේ 2022 වර්ෂයේ ඉදිකිරීම් නිම කරන ලද ලවණ බාධකයේ සැලැස්මෙහි දෝෂ සහගත තත්ත්වය බව ගොවි සංවිධාන නියෝජිතයින්ගේ අදහස විය.

2. ලවණ බාධකය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් අධ්‍යයන වාර්තාව සහ තාක්ෂණික අධ්‍යයනය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CCEB) විසින් සිදු කර ඇති අතර, එහිදී 2016/01/14 දිනැති වාර්තාව මඟින් සැලසුම් පිළිබඳ ලබා දුන් නිර්දේශයන් අනුව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.
3. ලවණ බාධකය ඉදිකිරීම ආශ්‍රිතව ආයතන සාකච්ඡා හා අනෙකුත් වාර්තා පදනම් කරගනිමින්, එම ඉදිකිරීම් ආශ්‍රිතව විවිධ ගැටලුකාරී තත්ත්වයන් පවතින බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.
4. ලංකා හයිඩ්‍රොලික්ස් ආයතනය විසින් සිදු කරන ලද පූර්ව අධ්‍යයන අවස්ථාවේදී නිල්වලා ගඟ ආශ්‍රිතව යම් භූමි ප්‍රදේශයකට ගංවතුර තත්ත්වයක් පවතින බව හෙළි කරගෙන තිබුණි.
5. එනමුත් එම ගංවතුර තත්ත්වය පාලනය කිරීමට හෝ අවම කිරීමට ගතයුතු ක්‍රමවේදයන් පිළිබඳව එහිදී අවධානය යොමු වී නොමැති බව නිරීක්ෂණය වන අතර, අධ්‍යයනයේ දක්වා ඇත්තේ පවතින ගංවතුර තත්ත්වයට මෙම ලවණ බාධකය ඉදිකිරීම බාධාවක් නොවන බව පමණි.
6. ගිවිසුම්ගත සමාගම වන ලංකා හයිඩ්‍රොලික්ස් ආයතනය, අනාගතයේදී ඇතිවිය හැකි කාලගුණික විපර්යාසයන් හෝ භූගෝලීය වෙනස්වීම් පිළිබඳව සහ ඒවායින් ඇතිවිය හැකි සංකූලතා හෝ සංකීර්ණතා පිළිබඳව ගැඹුරු අවධානයක් යොමු කොට නොමැති බව නිරීක්ෂණය වේ.
7. මෙලෙස සිදු කරන ලද අධ්‍යයනය පිළිබඳව ප්‍රදේශයේ ජනතාවගේ විශ්වාසනීයත්වයක් නොතිබූ බව පසුකාලීනව සිදු කරන ලද සාකච්ඡාවල කාර්ය සටහන් පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වේ.
8. ලවණ බාධකය ඉදිකිරීම හේතුවෙන් ජන ජීවිතයට මෙන්ම එම ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයට බාධා පැමිණෙමින් තිබෙන බව 2022 මාර්තු මාසය වන විටත් නිලධාරීන් හා ගොවි නියෝජිතයින් අතර සාකච්ඡා වෙමින් පැවති බව සටහන් මඟින් පෙනී යයි.
9. එම සාකච්ඡාවල කාර්ය සටහන්වලට අනුව ලවණ බාධකයේ දොරටුවල පවතින නොගැලපීම් සහ අලුතින් ඇතුළත් විය යුතු නව දොරටු සම්බන්ධයෙන් සාකච්ඡා වී ඇති අතර, එයින් පෙනී යන්නේ මෙම බාධකය ඉදිකිරීමට සැලසුම් කිරීමේදී මූලික අඩුපාඩු පැවති බවයි.

**5. රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය බිඳවැටීම සහ කළමනාකරණ දුර්වලතා**

1. 2024.01.26 දිනැතිව මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබා දෙන ලිඛිත දේශනය වෙත අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ, මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම වගවිය යුතු රාජ්‍ය ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන ගොස් නොමැති බවයි.
2. ව්‍යාපෘතියේ ආරම්භය සම්බන්ධයෙන් ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය විසින් මධ්‍යම පරිසර අධිකාරිය දැනුවත් කර නොමැති බව ද නිරීක්ෂණය වේ.
3. පූර්ව ඉංජිනේරු උපදෙස් පිළිපැදීම මඟහැරීම හෝ නොසලකා හැරීම සහ වගකිවයුතු රාජ්‍ය ආයතන අතර සම්බන්ධතාවය බිඳවැටීම නිසා, එක් එක් ආයතන සතුව පවතින විශේෂඥ දැනුම හුවමාරු කරගනිමින් ඉදිරියට මතුවන ගැටලු සහගත තත්ත්වයන් කල්තියා හඳුනා ගැනීමට තිබූ අවස්ථාවන් මඟහැරී ගොස් ඇත.
4. ලවණ බාධකය දිගින් දිගටම ගඟෙහි ජල ප්‍රවාහයට ඍණාත්මක බලපෑම් ඇති කිරීමට බලපා ඇති අනෙකුත් සාධක ලෙස: ගඟෙහි පළල වෙනස් වීම, රොන්මඩ තැන්පත් වීම, පෙර පැවති

තාවකාලික ලවණ බාධකයේ වැලි නිසි පරිදි බැහැර නොකිරීම, ගඟ දෙපස බාධක ඉවත් නොකිරීම, ගං ඉවුරු අවහිර වන අයුරින් කොන්ක්‍රීට් තාප්ප දැමීම සහ අනවසර නිවාස ඉදිකිරීම් හඳුනාගෙන ඇත.

5. 2019 වර්ෂයේ සිටම දිගින් දිගටම වගා හානි සිදු වී ඇති අතර, ඒ සඳහා තාවකාලික විසඳුම් ලෙස මූල්‍යමය සහන සලසා ඇති නමුත්, එම තත්ත්වය වැළැක්වීමට වෙනත් විකල්ප භාවිතයන් වෙත යොමු වීම් නිරීක්ෂණය නොවේ. එසේම හානි පරිපූර්ණය කිරීමේදී (වන්දි ගෙවීමේදී) විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොමැත.
6. කිරලකැලේ වාරිමාර්ග ව්‍යාපෘතිය හා නූපේ ඇළ මාර්ගය අවහිර වීම නිසා අතිරික්ත ජලය මුදාහැරීමට රජයට අමතර පිරිවැයක් දැරීමට සිදු වී ඇත.
7. ලවණ බාධකය ඉදිකිරීමේදී යෝජිත ජල නල එලීමේ සැලැස්ම වෙත පූර්ණ අවධානය යොමු නොකිරීම හේතුවෙන්, ජල නල එලීම සඳහා පසුව අලුතින් ඉඩම් අත්පත් කර ගැනීමට සිදුවීම නිසා විශාල අමතර වියදමක් දැරීමට සිදුවී ඇති බව නිරීක්ෂණය වේ.

## 6. විමර්ශන ක්‍රියාවලිය සහ කොමිෂන් සභාවේ අවසාන නිගමනය

1. මෙම තත්ත්වය පිළිබඳව වාරිමාර්ග, කාලගුණ, මධ්‍යම පරිසර අධිකාරිය, ජල සම්පාදන, නාගරික සංවර්ධන අධිකාරිය, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් සහ මාතර මහනගර සභාව ඇතුළු ආයතන ගණනාවක ප්‍රධානීන් හා නිලධාරීන් සාකච්ඡා පවත්වා ඇත.
2. කොමිෂන් සභා කාර්ය මණ්ඩලය විසින් ක්ෂේත්‍ර අධ්‍යයනයන් සිදු කිරීමෙන් දත්ත එක් රැස් කිරීම සිදු කර ඇත.
3. අවසාන නිගමනය: 2023 වර්ෂයේ ඇතිවූ වර්ෂාපතනයෙහි පෙර වර්ෂාවන්ට වඩා යම් වෙනසක් (වැඩි වීමක්) සිදුවී ඇති බව නිරීක්ෂණය වුවද, ලවණ බාධකය සැලසුම් කිරීමේදී සහ ඉදිකිරීම් අවස්ථාවේදී රාජ්‍ය ආයතනවල වගකීම නිසි අයුරින් ඉටු නොකිරීම හා පූර්ව ආපදා තත්ත්වය හඳුනා නොගැනීම හේතුවෙන්, මෙම ගංවතුර තත්ත්වය ඇතිවීමෙන් සිදු වූ ජනතා අගතියට රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාකලාපය සෘජුවම හේතු වී ඇති බව කොමිෂන් සභාව නිගමනය කරයි.

# 3 වන කොටස

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිගමන සහ නිර්දේශ වාර්තාව

**නිගමනය සහ නිර්දේශ**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මාතර දිස්ත්‍රික්කයේ ගංවතුර ගැටලුව සහ ලවණ බාධකය ඉදිකිරීම නිසා මතු වූ පාරිසරික හා සමාජයීය අර්බුදකාරී තත්ත්වය සම්බන්ධයෙන් සිදු කරන ලද පුළුල් විද්‍යාත්මක හා ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, 2023 වසරේදී ගංවතුර තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් වූ පැමිණිලිකරුවන් ඇතුළු සියලු තැනැත්තන්ගේ, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14 ව්‍යවස්ථාවන් මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් පහත දැක්වෙන වගඋත්තරකාර රාජ්‍ය පාර්ශවයන් විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව, 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව, මෙම නිල වාර්තාව එළිදැක්වීමෙන් අනතුරුව **මාස දෙකක් (02) ඇතුළත** මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ විධිමත් සැලැස්ම (Action Plan) කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන මෙන් මතු දැක්වෙන වගඋත්තරකරුවන්ට මෙයින් විධානය කර සිටිමු.

### 1. කෙටි කාලීන විසඳුම් (මාස 06ක් ඇතුළත ආරම්භ කළ යුතුය)

#### 1.1 ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

1. **වගා හානි විද්‍යාත්මක තක්සේරුව සහ වන්දි ලබා දීම:** ලවණ බාධකය ඉදිකිරීමෙන් අනතුරුව ගොවිබිම්වල ජලය එක්රැස් වීම නිසා සිදුව ඇති වගා හානි පිළිබඳව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම අධ්‍යයනාංශය හෝ රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම අධ්‍යයනාංශයේ තාක්ෂණික සහාය ඇතිව විද්‍යාත්මක තක්සේරුවක් සිදු කළ යුතුය. ඉන් අනතුරුව පවතින වත්මන් වෙළඳපොළ වටිනාකම අනුව අගතියට පත් ගොවීන් වෙත වගා හානි වන්දි වහාම ලබා දිය යුතුය.

#### 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර

1. **අවිධිමත් අංශ සහ ජීවනෝපාය අහිමි වූවන් සඳහා සහන:** කුඹුරු හිමියන් නොවන, නමුදු වී වගාව මෙන්ම අනෙකුත් වගාවන්හි දීර්ඝකාලීනව නියැලෙන අඳ ගොවීන් සහ කෘෂිකාර්මික ශ්‍රමිකයන්, දෛනික වෙළඳාම සිදුකරන පිරිස්, කුඩා ව්‍යාපාර හෝ වෙළඳසැල් හිමියන් සහ ගංවතුර තත්ත්වය හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ තාවකාලික පදිංචිකරුවන් නිවැරදිව හඳුනාගෙන ඔවුන් වෙත කඩිනම් මූල්‍ය හෝ ද්‍රව්‍යමය සහන ලබා දිය යුතුය.

## 2. මධ්‍ය කාලීන විසඳුම් (වසරක් ඇතුළත ආරම්භ කළ යුතුය)

### 2.1 ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

1. **ලවණ බාධකය පිළිබඳ පුනරීක්ෂණ අධ්‍යයනය:** ලවණ බාධකය ඉදිකිරීම නිසාවෙන් මේ වන විට නිර්මාණය වී ඇති සහ ඉදිරියේදී ඇතිවිය හැකි පාරිසරික හා සමාජයීය ගැටලු සම්බන්ධයෙන් නැවත අධ්‍යයනයක් සිදු කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා විශේෂඥ පුහුණුවලත් සම්පත්දායකයින්ගෙන් සැදුම්ලත් පිළිගත හැකි රාජ්‍ය නොවන ස්වාධීන ආයතනයකට හෝ විශ්වවිද්‍යාලයක සහාය ලබාගත යුතුය. මීට පෙර සිදුකරන ලද අධ්‍යයනයන් අසාර්ථක වූ ආයතනවලට නැවත අවස්ථාවක් ලබා දිය යුතුද යන්න පිළිබඳව ගැඹුරින් අවධානය යොමු කළ යුතුය.
2. **ජල නල එළීමේ ව්‍යාපෘතිය:** යෝජිත ජල නල එළීමේ වැඩසටහන ඵලදායී ආකාරයෙන් නිමකර ගැනීමට ප්‍රදේශයේ ගොවි සංවිධාන නියෝජිතයින් හා ඉඩම් හිමියන් සමඟ එක්ව කටයුතු කළ යුතුය. එමෙන්ම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය රාජ්‍ය අනුමත නීතිමය ක්‍රමවේදයකට අනුව කෙටි කාලයක් තුළදී අවසන් කර වන්දි ගෙවිය යුතුය.
3. **අන්තර්-ආයතනික විනිවිදභාවය:** ස්වභාවික හෝ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ඉදිරියේදී වුවද සිදුවිය හැකි ගංවතුර ප්‍රශ්න ඵලදායී ලෙස විසඳා ගැනීමට නම්, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි ආයතන අතර මනා අන්තර්-ආයතනික සන්නිවේදනයක් සහ සම්බන්ධතාවයක් ගොඩනගා ගත යුතු අතර, නිරන්තර විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

### 2.2 වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1. **රොන්මඩ සහ බාධා ඉවත් කිරීම:** ලවණ බාධකය ඉදිකිරීමට පෙර තිබූ තාවකාලික වැලි බාධකයේ සුන්බුන් පවතී නම් ඒවා කඩිනමින් ඉවත් කිරීමටත්, නිසි කලට නිසි ක්‍රමවේදයකට මාතර ප්‍රදේශයේ නිල්වලා ගඟ ඇතුළු අනෙකුත් අතු ගංගාවල රොන්මඩ ඉවත් කිරීමටත් ක්‍රියාමාර්ග ගත යුතුය. ගංගා දෙපස පවතින ස්වභාවික ජල ගැලීමට බාධා වන සියලු අවහිරතා ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
2. **ගඟේ ස්වභාවික පිහිටීම අධ්‍යයනය කිරීම:** නිල්වලා ගඟෙහි ස්වභාවික පිහිටීම අධ්‍යයනය කළ යුතුය. මෙහිදී ගඟ දෙපස පළල, ධාරිතාව, ගැඹුර හා ජලය ගලායාම විද්‍යාත්මකව අධ්‍යයනය කර, පෙර අධ්‍යයනයන් හා සන්සන්දනය කර වෙනස්කම් පිළිබඳව සැකැස්මක් සකස් කළ යුතුය. මේ සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගයද ලබා ගත හැකිය.
3. **ඕලන්ද ඇළ ප්‍රතිසංස්කරණය:** මේ වන විට වසා දමා ඇති ඕලන්ද ඇළ මාර්ගය නැවත විවෘත කිරීමට අවශ්‍ය තාක්ෂණික නිර්දේශ පළාත් පාලන ආයතන වෙත ලබා දිය යුතුය. ඕලන්ද ඇළ වසා දැමීම සිදුකර ඇත්තේ කුමන අවශ්‍යතාවයක් මතද සහ එකී ඇළ වසා දැමීම නිසාවෙන් ගංවතුර තත්ත්වයන් ඇතිවීමට යම් බලපෑමක් සිදු වී ඇත්ද යන්න ස්වාධීන පරීක්ෂණ කණ්ඩායමක් යොදා ගනිමින් සොයාබැලීම් කළ යුතුය.
4. **සංවර්ධන ව්‍යාපෘති දැඩි අධීක්ෂණය:** වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විෂය පථය තුළට අයත් ජල මූලාශ්‍රයක යම් සංවර්ධන කටයුත්තක් සිදු කරන්නේ නම්, එම සංවර්ධන කටයුත්ත ආරම්භයේ සිටම (සැලසුම් සකස් කිරීමේ සිට නිර්මිත අවධිය දක්වා) පූර්ණ අධීක්ෂණයන් සිදුකළ යුතුය.

ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි අහිතකර අතුරු ප්‍රතිඵලයන් පිළිබඳ අවධානයෙන් සිට ප්‍රමාදයකින් තොරව ඒවා වැළැක්වීමට කටයුතු කළ යුතුය. (ලවණ බාධකය ඉදිකරන අතරතුරදී වැලි කොට්ට නිසි අයුරින් ඉවත් නොකිරීම වැනි ක්‍රියාකාරකම් නිසි අධීක්ෂණයකට යටත් නොවීම නිසා අමතර පිරිවැයක් සහ කාලයක් දැරීමට සිදු වූ අහිතකර ප්‍රතිඵල මින් ඉදිරියට වළක්වා ගත යුතුය.)

5. **ප්‍රධාන ජල පොම්පාගාර යාවත්කාලීන කිරීම:** වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුව පවතින ප්‍රධාන ජල පොම්පාගාර ත්‍රිත්වයෙහි කාර්යාක්ෂමතාවය තක්සේරු කිරීමට සහ වඩා ඵලදායී සේවාවක් ලබා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. ඒ සඳහා දැරීමට සිදුවන පිරිවැය අවම කර ගැනීම පිණිස නව තාක්ෂණය (සුනිත්‍ය බලශක්ති මූලාශ්‍රයන්) භාවිතා කිරීමට ඇති හැකියාව කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර, ඒ සඳහා රාජ්‍ය පිළිගත් ආයතනයක සේවාව ලබාගත යුතුය.
6. **සහයෝගීතාවය:** ලවණ බාධකය ඉදිකිරීම හේතුවෙන් මතුව ඇති ගැටලුවලට සාධනීය පිළිතුරු සෙවීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට උපරිම තාක්ෂණික දායකත්වය ලබා දිය යුතුය.

### 2.3 මධ්‍යම පරිසර අධිකාරිය

1. **ජල පෝෂක ප්‍රදේශ සුරැකීම:** නිල්වලා ගඟෙහි ජල පෝෂක ප්‍රදේශවල සිදුවන වෙනස්කම් පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ නාගරික සංවර්ධන අධිකාරිය හා එක්ව ඒකාබද්ධ අධ්‍යයනයක් සිදුකළ යුතුය.
2. **ඉදිකිරීම් පාලනය:** වර්තමානය වන විට ගඟෙහි ස්වභාවික පැවැත්මට බාධාවන අයුරින් ඉදිකර ඇති ඉදිකිරීම් පාලනය කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මාතර නගර සභාව එක්ව කටයුතු කළ යුතුය.
3. **පූර්ව පාරිසරික ශක්‍යතා අධ්‍යයන:** යම්කිසි ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම එම ව්‍යාපෘතියේ සාර්ථක/අසාර්ථකභාවය හා එමගින් පරිසරයට සිදුවිය හැකි හානි සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය හා එක්ව විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් (Feasibility Study) සිදු කිරීම අනිවාර්ය වේ. මෙම ලවණ බාධක ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එලෙස නිසි අධ්‍යයනයක් සිදු නොකිරීම වත්මන් ගැටලුවලට ප්‍රධාන හේතුවක් වී ඇත.
4. **පරිසර නිර්දේශ කඩකිරීම්වලට එරෙහිව පියවර ගැනීම:** ලවණ බාධකය ඉදිකිරීම සඳහා ලබා දුන් නිර්දේශ සහ උපදෙස් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන්, එම මණ්ඩලයට එරෙහිව ගනු ලබන නීතිමය හෝ පරිපාලනමය පියවරයන් වහාම කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.

### 2.4 නාගරික සංවර්ධන අධිකාරිය

1. **ඉදිකිරීම් පිළිබඳ දත්ත පද්ධතිය:** මාතර ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය නිර්මාණය වීමට බලපා ඇති සියලුම ඉදිකිරීම් (නීත්‍යානුකූල හෝ අනවසර) පිළිබඳව මාතර මහ නගර සභාව හා එක්ව දත්ත රැස්කිරීම කළ යුතුය. ඒ සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන වෙතින් තාක්ෂණික සහාය ලබාගත යුතුය.
2. **නීතිමය පියවර:** නීත්‍යානුකූල නොවන (අනවසර) ඉදිකිරීම් සම්බන්ධයෙන් සුදුසු නීතිමය පියවරයන් හා විකල්ප ක්‍රියාමාර්ග වහාම ගත යුතුය.

3. **නගර සැලසුම්කරණය:** ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සමග එක්ව මාතර නගරයේ පිහිටීම සලකා බලා ඒකාබද්ධ නාගරික භෞතික සැලැස්මක් (Physical Plan) කඩිනමින් සකස් කළ යුතුය.
4. **ඕලන්ද ඇළ දත්ත:** දැනට වසා දමා ඇති ඕලන්ද ඇළ මාර්ගය පිළිබඳ තොරතුරු රැස්කර, වසා දැමීමට වූ හේතු පිළිබඳ අවධානය යොමු කොට ඒවා නැවත විවෘත කළ යුතු වන්නේ නම් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
5. **පාරිසරික සාධක අධ්‍යයනය:** නිල්වලා ගඟ ආශ්‍රිතව ගංවතුර තත්ත්වයට හේතු විය හැකි, තමන්ගේ විෂය පථයට අදාළ වන්නා වූ සාධකයන් (වැලි සංචිත එක්රැස් වීම වැනි) පිළිබඳව අධ්‍යයනය කර අදාළ ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.
6. **ජලාපවාහන පද්ධති යාවත්කාලීන කිරීම:** ගංගා හා අනෙකුත් ඇළ මාර්ගයන්හි ජලය බැස යාමට බාධාවන අයුරින් ඉදිකිරීම් සිදුකර ඇතිද යන්න හා ජලය බැසයාමට අනුමතව ඇති කාණු පද්ධතීන් පිළිබඳව අවධානය යොමු කළ යුතුය. නාගරික කාණු පද්ධති යාවත්කාලීන (Update) කළ යුතුය. පාලම් ඉදිකිරීමේදී අදාළ ආයතනයන්හි දත්ත භාවිතා කරමින් සහ අනාගත කාලගුණික තත්ත්වයන් (විශේෂයෙන් වර්ෂා කාලයේදී) සැලකිල්ලට ගනිමින් ඉදිකිරීම් කිරීමට යොමු විය යුතුය.

### 2.5 ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව

1. **භෞතික සැලැස්ම ක්‍රියාත්මක කිරීම:** මාතර නගරයේ පිහිටීම සහ භූගෝලීය ස්වභාවය සලකා බලා භෞතික සැලැස්මක් කඩිනමින් සකස් කර, එය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සියලුම පාර්ශවකාර රාජ්‍ය ආයතන වෙත නිල වශයෙන් ලබාදිය යුතුය.

### 2.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර

1. **තිරසාර සහන වැඩපිළිවෙල:** මාතර නිල්වලා නිම්නයේ දිගින් දිගටම ගංවතුර තත්ත්වයෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් දිගුකාලීන තිරසාර සුභසාධන වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.
2. **හානිපූර්ණ සමානත්වය:** වන්දි පූර්ණය කිරීමේදී පෙර වර්ෂවල පැවති ඌණතාවයන් සහ පක්ෂග්‍රාහීත්වයන් කෙරෙහි අවධානය යොමුකළ යුතු අතර, හානියට පත් සියලු පිරිස් වෙත සමසේ සහ සර්ව සාධාරණව ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය.
3. **අවදානම් කලාප කළමනාකරණය:** මාලිම්බඩ සහ තිහගොඩ යන ප්‍රදේශ ගංවතුර හේතුවෙන් නැවත ආපදා තත්ත්වයන්ට පත් නොවීමට අවශ්‍ය ස්ථිර යටිතල පහසුකම් සැලසීම සිදු කළ යුතුය.
4. **තාවකාලික වැසියන් සඳහා වන්දි:** තාවකාලිකව සිදු කරන ජීවනෝපායන් අහිමි වූ තැනැත්තන් සහ ස්ථිර පදිංචි නොවන පුද්ගලයින් කෙරෙහිද වන්දි ගෙවීමට විශේෂ අවධානය යොමුකළ යුතුය.
5. **ප්‍රජා සහභාගිත්වය:** ප්‍රදේශයේ ගොවි සංවිධාන සහ සිවිල් සංවිධාන සමඟ එක්ව නිරන්තරයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කළ යුතුය.

### 2.7 ප්‍රාදේශීය ලේකම් කාර්යාල(කඹුරුපිටිය, තිහගොඩ, මාලිම්බඩ සහ මාතර)

1. **හානිපූර්ණ විනිවිදභාවය:** ගංවතුර නිසා ඇති වූ හානිපූර්ණත්වය සිදුකිරීම සඳහා ග්‍රාම නිලධාරීවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම් මෙන්ම තාක්ෂණික රාජ්‍ය ආයතන සමඟ එක්ව පූර්ණ විනිවිදභාවයකින් යුතුව කටයුතු කළ යුතුය.
2. **විසඳුම් සඳහා දායකත්වය:** නිල්වලා ගඟෙහි ලවණ බාධකය ඉදිකිරීම සම්බන්ධයෙන් මතුව ඇති ගැටලුවලට බිම් මට්ටමින් විසඳුම් සෙවීම සඳහා වැඩි පරිපාලනමය දායකත්වයක් ලබා දිය යුතුය.
3. **අනවසර අවහිරතා ඉවත් කිරීම:** තම බල ප්‍රදේශයේ ජල බැස්මට බාධාවන අයුරින් ඉදිකර ඇති ඉදිකිරීම් හා වෙනත් වෙනස්කම් කඩිනමින් ඉවත් කිරීමට අනෙකුත් නීතිමය ආයතන හා එක්ව කටයුතු කළ යුතුය.

### 2.8 මාර්ග සංවර්ධන අධිකාරිය

1. **මාර්ග ආශ්‍රිත ජල අවහිරතා:** ගංගා හා අනෙකුත් ඇළ මාර්ගයන්ගේ ජලය බැසයාමට බාධාවන අයුරින් මහාමාර්ග ආශ්‍රිත ඉදිකිරීම් සිදු කර ඇති දැයි සොයා බැලිය යුතු අතර, ජලය බැසයාමට අනුමතව ඇති කාණු පද්ධතීන් පිළිබඳව අවධානය යොමු කළ යුතුය.
2. **කාණු පද්ධති ප්‍රතිසංස්කරණය:** ජලය බැසයාමට බාධාවන අයුරින් සිදුකර ඇති මාර්ග බාධක ඉවත්කර, මාර්ග දෙපස කාණු පද්ධතීන් පවතින උපරිම ජල ධාරිතාවන්ට ගැළපෙන පරිදි යාවත්කාලීන කළ යුතුය.

### 2.9 ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය

1. **ආපදා පූර්ව අධ්‍යයනය:** ආපදා තත්ත්වයන් පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදුකිරීම සහ අවදානම් කලාපවල ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් තවදුරටත් වර්ධනය කළ යුතුය.
2. **පූර්ව සහ පශ්චාත් දැනුවත් කිරීම්:** ආපදා පූර්ව තත්ත්වය, ආපදාව සිදුවන අවස්ථාව සහ පශ්චාත් ආපදා (After-disaster) තත්ත්වයන් කෙරෙහි ජනතාව සූදානම් කිරීමේ සන්නිවේදන වැඩසටහන් තවදුරටත් පුළුල් කළ යුතුය.
3. **සර්ව සාධාරණ සහන සේවා:** ආපදාවන්ට ලක් වූවන්ට හදිසි සහන සැලසීමේදී කිසිදු භේදයකින් තොරව සර්ව සාධාරණ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

### 2.10 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය

1. **භූගෝලීය සිතියම්කරණය:** වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා එක්ව නිල්වලා ගඟෙහි ස්වභාවික පිහිටීම (ගඟ දෙපස පළල, ධාරිතාව, ගැඹුර හා ජලය ගලායාම) අධ්‍යයනය කළ යුතුය. පෙර අධ්‍යයනයන් හා සන්සන්දනය කර වෙනස්කම් පිළිබඳව සැකැස්මක් සකස් කළ යුතුය.
2. **වැලි සංචිත අධ්‍යයනය:** නිල්වලා ගඟ ආශ්‍රිතව ගංවතුර තත්ත්වයට හේතු විය හැකි, තමන්ගේ විෂය පථයට අදාළ වන්නා වූ සාධකයන් (වැලි සංචිත අහිතකර ලෙස එක්රැස් වීම වැනි) පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

**2.11** මාතර මහ නගර සභාව

1. **දේශීය නාගරික සැලසුම්:** නාගරික සංවර්ධන අධිකාරිය හා එක්ව මාතර නගර සභා බල ප්‍රදේශයේ පිහිටීම සලකා බලා ප්‍රාදේශීය භෞතික සැලැස්මක් කඩිනමින් සකස් කිරීමට පූර්ණ දායකත්වය සහ අනුමැතිය ලබා දිය යුතුය.

**2.12** වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

1. **වෙරළ කලාප ඉදිකිරීම් පාලනය:** වර්තමානය වන විට ගඟ මුහුදට ගලා බසින ප්‍රදේශයේ ස්වභාවික පැවැත්මට බාධාවන අයුරින් වෙරළ ආශ්‍රිතව සිදුකර ඇති ඉදිකිරීම් පාලනය කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය සහ මාතර නගර සභාව එක්ව කටයුතු කළ යුතුය.

**3.** දිගු කාලීන විසඳුම් (වසර **02**ක් ඇතුළත ආරම්භ කළ යුතුය)

**3.1** සියලුම රාජ්‍ය ආයතනවල පොදු වගකීම

1. **අඛණ්ඩ සම්බන්ධීකරණය:** ඇතිවූ ගංවතුර තත්ත්වයන් නිසාවෙන් මතුවූ ගැටලු විසඳීමට උක්ත සියලුම රාජ්‍ය ආයතනවල පූර්ණ දායකත්වය ලබාදිය යුතුය. එය ගංවතුර තත්ත්වයන් ඇතිවූ විටදී පමණක් තාවකාලිකව සිදු නොකර, නිරන්තරයෙන් ඉදිරි ආපදා තත්ත්වයන් පිළිබඳව ආයතන අතර අඛණ්ඩ සන්නිවේදනයක් සහ සම්බන්ධතාවයක් පවත්වාගත හැකි ස්ථිර පාලන ව්‍යුහයක් සැකසිය යුතුය.

**3.2** වාරිමාර්ග දෙපාර්තමේන්තුව

1. **ඉහළ නිම්න ජලාශ යෝජනා ක්‍රම:** නිල්වලා ව්‍යාපෘතියේ මුල් සැලසුම්වල දක්වා ඇති පරිදි, පහළ නිම්නයේ ගංවතුර පාලනය කිරීම සඳහා ඉහළ ජල පෝෂක ප්‍රදේශවල ජලය එක්රැස් කර රඳවා තැබිය හැකි වැව් හෝ ජලාශ ඉදිකිරීමේ මහා පරිමාණ යෝජනාවන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

**3.3** ජනාධිපති ලේකම් කාර්යාලය

1. **දේශපාලන බලපෑම්වලින් තොර ප්‍රතිපත්ති සම්පාදනය:** ඉදිරි ජාතික සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමේදී බලපෑම්වලින් තොරව, සියලුම වගකිව යුතු තාක්ෂණික හා පරිපාලනමය රාජ්‍ය ආයතන එකට එක්ව බිම් මට්ටමේ සිට විද්‍යාත්මක සාකච්ඡා පවත්වා තීරණ ගත යුතු බවට වන ජාතික ප්‍රතිපත්තියක් සහ නියෝග සකස් කළ යුතුය.

**3.4** ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

1. **ස්ථිර ආපදා හානිපූර්ණ අරමුදල:** මෙවැනි මහා පරිමාණ ඉදිකිරීම් අතරතුරදී හෝ නිර්මිතයෙන් පසුව සිදුවිය හැකි අතුරු ආපදා තත්ත්වයන් (Collateral Damage) හේතුවෙන් මහජනතාවට සිදුවන හානිකර තත්ත්වයන් සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි හානි පූරණය කිරීමට හැකිවන

අයුරින්, ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ස්ථිර "ආපදා හානිපූර්ණ භාර අරමුදලක්" (Disaster Compensation Trust Fund) ආරම්භ කර පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**Central Environmental Authority.** (2017). *Environmental approval and conditions for the Nilwala river salinity barrier project (Ref: CEA/EIA/2017/10/11)*. Central Environmental Authority of Sri Lanka.

**Disaster Management Centre.** (2014). *Sri Lanka comprehensive disaster management programme 2014–2018*. Ministry of Disaster Management.

**Disaster Management Centre.** (2023). *Situation report on Southwestern monsoon floods and landslides - October 2023*. Ministry of Defense.

**Lanka Hydraulics Institute.** (2016). *Hydraulic design and numerical model simulation for the proposed salinity barrier across Nilwala River (Final Report)*. Lanka Hydraulics Institute Ltd.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.** (1978). රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත, අංක 21.** (1996). රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව.

**United Nations.** (1948). *Universal declaration of human rights*. UN General Assembly.

**United Nations General Assembly.** (1966). *International covenant on economic, social and cultural rights*. United Nations Treaty Series, 993, 3.

*මාතර ගංවතුරෙන් දෛනික ජීවනෝපායට බාධා*. (2023, ඔක්තෝබර් 10). අරුණ පුවත්පත, පි. 04.

*මාතර ජනාවාසවලට කිඹුල් තර්ජන දැඩි වෙයි*. (2023, නොවැම්බර් 12). අරුණ පුවත්පත, පි. 02.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
අංක 14, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ
04. ශ්‍රී ලංකා
දුරකතනය +94 11 2505595
පැක්ස් +94 11 2505541
ඊමේල්: sechrcsl@gmail.com
වෙබ් අඩවිය: www.hrcsl.lk